අමාත්‍යාංශ චක්‍රලේඛ අංක:-95/7(III).

මගේ අංකය:4/ගුරුආ/1/3099.
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
1995 අප්‍රේල් මස 26දින.

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියළුම කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

**ශ්‍රී ලංකා ගුරු සේවය පිහිටුවීම - ගුරුවරුන් අන්තර්ග්‍රහණය කිරීම සහ නව වැටුප් පරිමාණයන් ගෙවීම**

ඉහත සඳහන් කරුණට අදාල චක්‍රලේඛ අංක.95/7(I), 95/7(II) චක්‍රලේඛයන්ට අමතරවයි.

ශ්‍රී ලංකා ගුරු සේවය පිහිටුවීම යටතේ ගුරු භවතුන්ගේ අන්තර්ග්‍රහණය කිරීමට අදාලව විවිධ පාර්ශවයන් විසින් මෙම අමාත්‍යාංශයෙන් විමසා ඇති කරුණු අනුව තවදුරටත් කරුණු පැහැදිලි කිරීමක් වශයෙන් මෙම චක්‍රලේඛය එවනු ලැබේ. ඉහත සඳහන් චක්‍රලේඛ මගින් ම විසින් දෙන ලද උපදෙස් වලට අමතරව මෙහි සහත සඳහන් පැහැදිලි කිරීම් අනුව කටයුතු කරන ලෙස දන්වමි.

(1). **කාර්යක්ෂමතා කඩඉම් අසමත්වීම හේතුවෙන් විලම්භනය කරන ලද වැටුප් වර්ධක වාසි**

ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව අනුව ගුරුවරුන් අන්තර්ග්‍රහණය කිරීමේදී ඔවුන්ගේ සතුටුදායක සේවා කාලය සැලකිල්ලට ගතයුතු අවස්ථාවලදී කිසියම් ගුරු භවතකුගේ වාර්ෂික වැටුප් වැඩිවීම් ඔහු විසින් උපයා ගෙන නොමැත්තේ හුදෙක් ම කාර්යක්ෂමතා කඩඉම් අසමත්වීම හේතුවෙන් නම් එම වාර්ෂික වැටුප් වර්ධක අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය සඳහා පමණක් ගුරු භවතා විසින් උපයාගෙන ඇති සේ සලකා අදාල වැටුප් පියවරෙහි ගුරු භවතා පිහිටු විය යුතු ය. අන්තර්ග්‍රහණ ක්‍රියාවලියේදී සතුටුදායක සේවා කාලයකට එකතු නො කළ යුත්තේ විනය හේතුවක් නිසා හෝ වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම නිසා හෝ වෙනත් ආකාරයක දඬුවමක් වශයෙන් හෝ අහිමි කරන ලද වාර්ෂික වැටුප් වර්ධකයන්ට අදාල සේවා කාලයන් ය.

**උදාහරණයක් වශයෙන්:-**

වෘත්තිය සුදුසුකම් නොලද උපාධිධාරියෙකු සිය සේවා කාලයෙහි 12 වන වසරට එළඹ ඇත්තේ නම් සහ එම මුළු සේවා කාලය තුලම දඬුවමක් වශයෙන් හෝ වැටුප් රහිත නිවාඩු ලැබීම හේතුව නිසා හෝ වැටුප් වර්ධක විලම්භනය කරනු ලැබීමට යටත් වී නැත්නම් ඔහු 2 පන්තියේ II ශ්‍රේණියේ රු.60,120/= වැටුප් පියවරෙහි පිහිටු විය යුතු ය.

2.....

2). **කෘෂිකර්ම විද්‍යා ඩිප්ලෝමාධාරීන්**

කෘෂිකර්ම විද්‍යා ඩිප්ලෝමාධාරීහු ගුරු පුහුණුව රහිත ඩිප්ලෝමාධාරීන් වශයෙන් සලකා 3 පන්තියේ I ශ්‍රේණියේ පිහිටුවා වැටුප් සකස් කළ යුතු ය. ඔවුන් සිය ඩිප්ලෝමා පාඨමාලාවට අමතරව ගුරු පුහුණුවක් ලබා ඇත්නම් එවැනි අය ගුරු පුහුණුව සහිත ඩිප්ලෝමාධාරීන් වශයෙන් සළකා කටයුතු කළ යුතු ය.

3). **පුහුණු ගුරුවරයෙකු වශයෙන් සලකන ලද ඩිප්ලෝමාධාරීන්**

කිසියම් ඩිප්ලෝමාධාරී ගුරු භවතකු පුහුණු ගුරුවරයෙකු වශයෙන් සළකා මෙතෙක් වැටුප් ගෙවා ඇත්නම් එවැනි ගුරු භවතුන් ගුරු පුහුණුව සහිත ඩිප්ලෝමාධාරීන් වශයෙන් සැලකිය යුතු ය.

4). **උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ බඳවා ගන්නා ලද ගුරුවරුන්**

උපාධිධාරී අභ්‍යාසලාභී ක්‍රමය යටතේ බඳවා ගන්නා ලද ගුරුවරුන් විවිධ අවස්ථාවන්හි දී විවිධාකාරයේ පත්වීම් ලිපි මත බඳවා ගෙන ඇත. මෙම ගුරුවරුන් වෙත නිකුත් කරනු ලැබ ඇති පත්වීම් ලිපි කාර්යාලයෙන් කාර්යාලයට වෙනස් වී ඇති බව පෙනේ. මෙම ක්‍රමය යටතේ බඳවා ගන්නා ගුරුවරුන්ට ලබා දී ඇති මුල් පත් ලිපිය අනුව ඔවුන් උපාධිධාරී උප ගුරුවරුන් වශයෙන් හෝ උපාධිධාරී සහායක ගුරුවර වශයෙන් හෝ පත් කරනු ලැබ ඇතැයි සඳහන් වන්නේ නම් ස්ථාවර කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව ඔවුන් එම පත්වීම ලද දිනයේ සිට උපාධිධාරී ගුරුවරුන් වශයෙන් සැලකිය යුතු ය. පත්වීම් ලිපියෙහි ඔවුන්ගේ පත්වීම අභ්‍යාසලාභී පත්වීමක් වශයෙන් සඳහන් වන්නේ නම් ඔවුන්ගේ උපාධි ගුරු සේවා කාලය ගණන් ගත යුත්තේ ඔවුන්ට උපා ගුරු පත්වීම ලබා දුන් දින සිට ය. මේ නිසා ඇති විය හැකි විෂමතාවයන් පිළිබඳව ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි සඳහන් ස්ථාවර කමිටුව පිහිටුවීමෙන් පසුව ක්‍රියා කර ඇත. මෙම ගුරු භවතුනට ගුරුවරයෙකු වශයෙන් දෙන ලද පත්වීම හැර වෙනත් ප වීමක් ලබා දී නොමැත්තේ නම් ඔවුනට මෑතදී ලබා දී ඇති විශේෂ වැටුප් ක්‍රමය ගේ නව ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබීමේ අවස්ථාව අහිමි කළ යුතු නොවේ.

සේනානායක - උපසේන
අතිරේක ලේකම් (පාලන)
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම් වෙනුව

**පිටපත :-**

අ. සේ. ම. / ලේ.